# ACCOUNTING FOR PARTNERSHIP (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# හවුල් ව්‍යාපාර

1890 හවුල් ආඥා පනතට අනුව හවුල් ව්‍යාපාරයක් යනු, ලාභ ලැබීමේ පරමාර්ථයෙන් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාවයයි.

# හවුල් ව්‍යාපාරයක තිබිය යුතු ප්‍රධාන අංග

- පුද්ගලයින්
- පොදු එකඟතාව
- ව්‍යාපාරයක්
- ලාභ ලැබීමේ පරමාර්ථ

ClassWork.LK

# හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ වන නීතිමය අණ පනත්

- 1890 හවුල් ආඥා පනත
- 2007 අංක 7 දරණ සමාගම් පනතේ 519 වගන්තිය
- 1840 අංක 7 දරණ වංචා වැළැක්වීමේ ආඥා පනත
- 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත

# හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළ හැකි ආකාර

- ලිඛිතව
- වාචිකව
- පාර්ශ්වයන්ගේ හැසිරීමෙන්

හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුමක් තිබේ නම්, එය වඩාත් යෝග්‍ය වේ.

ClassWork.LK

# හවුල් ගිවිසුමක ඇතුළත් කළ හැකි කොන්දේසි

- හවුල්කරුවන් ප්‍රාග්ධනයට දායක වන ආකාරය
- හවුල්කරුවන් කළමනාකරණයට දායක වන ආකාරය
- හවුල්කරුවන් ලාභාලාභ බෙදා ගන්නා ආකාරය
- හවුල්කරුවන්ගේ වේතන හිමිවන ආකාරය
- ප්‍රාග්ධන පොළී හිමිවන ආකාරය
- කීර්ති නාමය වාර්තා කරන ආකාරය
- හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අමතර ව ව්‍යාපාරයට සපයා ඇති ණය සඳහා පොළී ගෙවන ආකාරය

ClassWork LK

# හවුල් ආඥාපනතේ 24 වන වගන්තිය

ලිඛිත ගිවිසුමක් නොමැති නම් හෝ ගිවිසුමක ඇතුළත් නොවූ කරුණු සම්බන්ධයෙන් හවුල් ආඥාපනතේ 24 වන වගන්තිය අනුව, ගිණුම්කරණ ගැටලු නිරාකරණය කළ යුතුය.

## 24 වන වගන්තියේ ඇතුළත් ගිණුම්කරණයට අදාළ ප්‍රධාන වගන්ති

- ප්‍රාග්ධනයට කෙසේ දායක වී තිබුණ ද ලාභාලාභ සමාන ව බෙදා ගත යුතු යි.

- හවුල්කරුවන් ප්‍රාග්ධනයට අතිරේක ව සපයා ඇති ණය සඳහා 5% ක වාර්ෂික පොළියක් හවුල්කරුවන්ට හිමි වේ.

- පාලන කටයුතුවලට සෑම හවුල්කරුවෙක් ම සහාය විය යුතු අතර, ඒ සඳහා වේතනයක් හිමි නොවේ.

ClassWork.LK

- දායක වූ ප්‍රාග්ධනය සඳහා පොළි ලැබීමට කිසිදු හවුල්කරුවෙකුට හිමිකමක් නොමැත.

- හවුල් ව්‍යාපාරයේ වියදමක් හවුල්කරුවන් තම පුද්ගලික මුදලින් ගෙවා ඇත්නම්, ඒ මුදල ප්‍රතිපූරණය කිරීමේ හැකියාව හවුල්කරු සතු වේ.

ClassWork.LK

# 1890 හවුල් ආඥා පනතේ 42 වගන්තිය

1890 හවුල් ආඥා පනතේ 42 වගන්තිය අනුව, විශ්‍රාම යන / ඉවත් වන / මිය යන හවුල්කරුවන්ගේ හිමිකම් කොටස එදින නොගෙවන්නේ නම්, එදින සිට ගෙවන දින දක්වා කාලය සඳහා 5% ක වාර්ෂික පොළියක් ගෙවීම කළ යුතු ය.

# 2007 අංක 07 දරණ සමාගම් පනතේ 519 වගන්තිය

2007 අංක 07 දරණ සමාගම් පනතේ 519 වගන්තිය අනුව යම් හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජික සංඛ්‍යාව 20 බවට සීමා කර ඇත.

හවුල් ගිවිසුමක් නොමැති විට හෝ යම් කැරණක් සම්බන්ධයෙන් ගිවිසුමෙහි සඳහන් නොවූ විට හවුල් ව්‍යාපාරයක යම් ගැටලුවක් යම් මතු වුවහොත් එම ගැටලුව ද හවුල් ආඥා පනතේ විධි විධාන අනුව විසඳා ගත යුතු ය.

ClassWork.LK

# අභ්‍යාස

(01) 1890 හවුල් ආඥාපනතට අනුව හවුල් ව්‍යාපාර නිර්වචනයේ ඇතුළත් ප්‍රධාන කරුණු කවරේද?

(02) පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට අදාළ ව අදහස් ඉදිරිපත් කරන්න.

ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවක ලබා ගත් ප්‍රාග්ධන පොළිය

ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවක ලබා ගත් හවුල් වේතන

ලිඛිත ගිවිසුමක් නොමැති විටෙක හවුල්කරුවන් පුද්ගලික මුදලින් දරා ඇති ව්‍යාපාරික වියදම්

ClassWork.LK

(03) ලිහිණි රු 300 000 ක් හා මධුර රු. 200 000 ක් ප්‍රාග්ධනය යොදා ධීවර හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර, මුළු මුදලින් බෝට්ටුවක් ලබා ගෙන මෙහෙයුම් කටයුතු ආරම්භ කළ මුල් දිනයේ ම බෝට්ටුව සම්පූර්ණයෙන් ම විනාශවීමෙන් ව්‍යාපාරය විසුරුවා හැරීමට තීරණය කරන ලදී.

එක් එක් හවුල්කරුවන්ගේ අලාභ කොටස් කොපමණද?

(04) හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් 2007 අංක 07 සමාගම් පනත බලපාන ආකාරය පැහැදිලි කරන්න.

ClassWork.LK



පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
ACCOUNTING
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු 26
ලියාපදිංචි වීමට :-
076 36 55 550
සෙනසුරාදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura